# විචාරාත්මක චින්තනය හා එහි උපයෝගිතාව

**හඳගිරියේ සිරිසුමන හිමි**

## ප්‍රවේශය

බුදු දහම අනුව "මනං උස්සතීති මනුස්සං" 'මනසින් උසස් ය' යන අදහස මත මානවයාට 'මිනිස්' යන නාමය ලැබී ඇත. ලෝකයේ ජීවත් වන විවිධ සත්ත්ව වර්ග අතර උසස් සත්ත්ව කොට්ඨාසයක් ලෙස මිනිසා හඳුන්වනුයේ ඔවුන් සතු අනර්ඝ වස්තුව වන සිතීම හා ඒ අනුව ක්‍රියා කිරීමේ හැකියාව අන්‍ය සත්ත්වයන්ට වඩා වැඩි හෙයිනි. සමාජීය සත්ත්වයකු වශයෙන් මිනිසා බහු සමාජීය වපසරියක අනේකවිධ පුද්ගලයන් සමග අන්තර් සබඳතා පැවැත්විය යුතු ය. ළදරුවියේ සිට අන්‍ය පුද්ගලයන් සමග අන්තර් සබඳතා පැවැත්වීමෙන් දරුවකු සිය ප්‍රජානනය සංවර්ධනය කර ගනියි. ඉගෙනීම යනු අත්දැකීම්වල ප්‍රතිඵලයක් වශයෙන් චර්යාවේ හෝ දැනුමේ ස්ථිර වෙනසක් ලෙස සරලව හඳුනා ගත හැකි ය. ඉගෙනීම පිළිබඳ විවිධ අර්ථකථන මෙන්ම ඉගෙනීම පිළිබඳ න්‍යායන් ද රැසකි. ඉගෙනීම වනාහි අනුක්‍රමයෙන් සිදුවන මානසික ක්‍රියාවලියක් බව ෆේගන්ගේ (1958) අදහසයි. දරුවකුට භෞතිකව හෝ අභෞතිකව මුන ගැසෙන අත්දැකීම් මනසින් විග්‍රහ කර ගනිමින් සිය බුද්ධිය සංවර්ධනය කර ගනියි.

පුද්ගලයා සතු චින්තන හැකියා හා තාර්කික හැකියාවේ උත්කෘෂ්ඨ බව තාක්ෂණික අභිවෘද්ධියත්, අග්‍රගන්‍යය කලාකෘතිත් විදහා දක්වනු ඇත. චින්තන වර්ගීකරණ අතර නිර්මාණශීලී

චින්තනය හා විචාරාත්මක චින්තනය නේකවිධ අංශයන්හි ප්‍රගමනයට තුඩු දෙන චින්තනයන් ය. චින්තනය මානසික ක්‍රියාවලියක් වන අතර එය කුසලතා රැසක් හා සම්බන්ධ වේ. විචාරාත්මක චින්තනය ද ඒ ඒ අවස්ථාවට අනුව වෙනස් වේ. සරලව විමසීමේදී විචාරාත්මක චින්තනය යනු යම් අවස්ථාවක් හෝ සිද්ධියක් පිළිබඳව විචාරාත්මකව සිතා බැලීම වශයෙන් හැඳින්විය හැකි ය.[1] ඒ අනුව පුද්ගලයාට භෞතිකව හා අභෞතිකව මුන ගැසෙන අත්දැකීම් විවිධ දෘෂ්ටිකෝණයන්ගෙන් සිතා බැලිය හැකි ය. එය තර්කානුකූල පදනමක පිහිටිය යුතු ය. එනම්, සාක්ෂි සහිත විය යුතු ය යන්නයි. විචාරාත්මක චින්තනය බොහෝ අධ්‍යාපනඥයන් "critical thinking", "higher order thinking'', "problem solving"[2] ආදී වශයෙන් හඳුන්වා ඇති අතර ඩිවි (Dewey) ''පරාවර්තක චින්තනය'' (reflective thinking) ලෙස හඳුන්වා ඇත.[3] කෙසේ වුව ද විචාරාත්මක චින්තනය සංජානන ක්‍රියාවලියේ අත්‍යවශ්‍ය සංරචකයක් ලෙස සැලකේ.[4]

## විචාරාත්මක චින්තනයෙහි ස්වභාවය

පුද්ගලයාගේ අත්දැකීම් අනුව අදහස් හා ගැටලු පිළිබඳව ඔහු දරණ ආකල්ප විචාරාත්මක චින්තනය නම් වන බව මැක්ඩොනල්ඩ්ගේ අදහසයි.[5] ඒ අනුව පුද්ගලයාගේ අත්දැකීම් මත ඔහුගේ ආකල්ප ධනාත්මක හෝ ඍණාත්මක විය හැකි ය. එකී අදහස් වෙනත් පුද්ගලයෙකුට හෝ කණ්ඩායමකට විචාරයට ලක් කළ හැකි ය. ශිෂ්‍යයකුට සිය අධ්‍යාපන කාර්ය සාඵල්‍යය උදෙසා තාර්කික විචාරාත්මක චින්තනය අත්‍යවශ්‍යය වේ. දෛනික ජීවන ගැටුම් කළමනාකරණය සඳහා ද විචාරාත්මක චින්තනය පුද්ගලයාට අත්‍යවශ්‍යය වේ. නිර්මාණශීලී නව්‍ය නිර්මාණ සඳහා ඉවහල් වනුයේ ද විචාරාත්මක චින්තනයයි. නව දාර්ශනිකයන් බිහිවනුයේ ද විචාරාත්මක චින්තනය නිසාවෙනි. යමක් දෙස විවිධ මාන ඔස්සේ බැලීමේ හැකියාව සෑම පුද්ගලයෙකුට ම නැත. සාමාන්‍ය වශයෙන් විවිධ පැතිකඩ ඔස්සේ බැලීමේ හැකියාව සහිත පුද්ගලයන් සිටිය ද තීක්ෂණ ඥානයකින් යමක් දෙස බලන පුද්ගලයන් අල්ප ය. ඔවුන් දාර්ශනිකයන් ය. සරල



නිදර්ශනයක් වශයෙන් අයිසැක් නිවුටන් ඇපල් ගසින් වැටුන ගෙඩිය උඩට නොයා පහළට පතිත වූයේ කුමන හේතුවක් නිසාදැයි විචාරාත්මකව හා තාර්කිකව නොසිතුයේ නම් ගුරුත්වාකර්ශනය සොයාගත නොහැකි ය. තථාගත බුදුරජාණන් වහන්සේට විචාරාත්මක චින්තනය නොතිබූයේ නම් කාමසුඛල්ලිකානු යෝගය හා අත්තකිලමතානු යෝගය අතැර මධ්‍යම ප්‍රතිපදාව නැමැති නිවැරදි මගට අවතීර්ණව බුදු බව ලබාගත නොහැකි ය. නව නිපැයුම් හා නව දාර්ශනික මත ආදිය ලොවට දායාද වීමට පුද්ගල විචාරාත්මක චින්තනය අත්‍යවශ්‍ය බව මේ අනුව හඳුනාගත හැකි ය.

## විචාරාත්මක චින්තනයේ උපයෝගිතාව

විචාරාත්මක චින්තනය හා එහි උපයෝගිතාව පිළිබඳ විවිධ අදහස් ඉදිරිපත්ව ඇති අතර ඒ පිළිබඳ විග්‍රහය විවිධ මාන ඔස්සේ විමසිය හැකි ය. විචාරාත්මක චින්තනය ස්වයං මග පෙන්වීමකි. ආත්ම විනයානුගත සිතුවිලි, සාධාරණ සිතුවිල්ලකින් ඉහළම මට්ටමේ ගුණාත්මක භාවයෙන් යුක්තව සිතීමට උත්සාහ කිරීමකි. ඒ අනුව විචාරාත්මකව හිතන අය හිතාමතාම බුද්ධිමත් ලෙස ජීවත්වීමට උත්සාහ දරන අතර මිනිසුන්ගේ චින්තනයේ ස්වභාවයන් මෙන් ම ආත්මාර්ථකාමී හා සමාජ කේන්ද්‍රීය ප්‍රවණතාවන් ඔවුන්ට හඳුනාගත හැකි ය. විශ්ලේෂණය, තක්සේරු කිරීම, සංකල්ප සහ ප්‍රතිපත්ති යන බුද්ධිමය මෙවලම් විචාරාත්මක චින්තනයේදී භාවිත වේ. මෙමගින් තර්කානුකූල හැකියාවන් දියුණු කරගත හැකි අතර, විවිධ අගතීන්, අවිවේචනාත්මකව පිළිගත් සමාජ නීති සහ විවිධ තාර්කිකයන් ද හඳුනාගත හැකි ය. විචාරාත්මක චින්තනය ඇති පුද්ගලයන් බෙහෙවින් සංකීර්ණ ගැටලු ගැන සරලව සිතා බැලීමෙන්, අනිත් අයගේ අයිතිවාසිකම් හා අවශ්‍යතා නිසි ලෙස සලකා බැලීමට උත්සාහ කරන බව ලින්ඩා එඩ්ලර්ගේ අදහසයි.[6] විචාරාත්මක චින්තනය ස්වයං පරාවර්තනය (Self-reflective) සඳහා තීරණාත්මක ය. එසේ ම අර්ථවත් ජීවිතයක් ගත කිරීම හා ජීවිත හැඩගස්වා ගැනීම සඳහා පුද්ගලයාගේ වටිනාකම් සහ තීරණ

සාධාරණීකරණය කිරීම හා පරාවර්තනය කිරීම සඳහා ද අවශ්‍ය වන්නකි.

එසේ ම විචාරාත්මක චින්තනය ස්වයං ඇගයීම සඳහා වන මෙවලමක් ද වේ.[7] මෙය දිගුකාලීන යාවජීව ඉගෙනුමක් වශයෙන් ද හඳුනාගත හැකි ය. එසේ ම සාමාන්‍ය ජීවිතයේදී නිර්මාණශීලීව මෙන්ම පුළුල්ව සිතීමට උපකාරී වන අතර එය උසස් අධ්‍යාපනයේ දී යම් ප්‍රස්තුතයක් විනිශ්චය කිරීමට, ඇගයීමට සහ ගැටලු විසඳීමට ඇති හැකියාවන් දියුණු කිරීමට ද මග පාදනු ඇත. විචාරාත්මක චින්තනය යනු චින්තකයා ඔහුගේ චින්තනයේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම හා චින්තනයේ අන්තර්ගත ව්‍යුහයන් දක්ෂ ලෙස භාර ගනිමින් ඔවුන් මත බුද්ධිමය සම්මතයන් පැනවීම වශයෙන් ද අර්ථ දැක්විය හැකි ය. වැදගත් ප්‍රශ්න සහ ගැටලු මතුකර, ඒවා පැහැදිලිව හා නිවැරදිව සකස් කිරීමට අදාළ තොරතුරු රැස් කිරීම හා තක්සේරු කිරීම, එය අර්ථකථනය කිරීම සඳහා කෙටිකාලීන අදහස් භාවිත කිරීම, හොඳින් නිර්වචනය කළ නිගමන සහ විසඳුම් වෙත යොමු කර ඇති අදාළ නිර්ණායක හා ප්‍රමිති පරීක්ෂා කිරීමට විකල්ප ක්‍රමවේදයන් තුළ විවෘත මනසකින් යුතුව සිතීම, අවශ්‍ය පරිදි ඒවායේ උපකල්පන මෙන් ම ප්‍රායෝගික ප්‍රතිවිපාක පිළිබඳව හඳුනා ගැනීම සහ තක්සේරු කිරීම, සංකීර්ණ ගැටලුවලට විසඳුම් සොයා ගැනීම සඳහා අන් අය සමග ඵලදායී ලෙස සන්නිවේදනය කිරීමට විචාරාත්මක චින්තය අවශ්‍ය වේ.[8] ස්වයං විචලනය, ආත්මවිනයානුගත, ආත්ම අධීක්ෂණය සහ ස්වයං නිවැරදි කිරීමේ චින්තනය වශයෙන් ද දැක්විය හැකි ය.[9] විශිෂ්ටත්වයේ දැඩි ප්‍රමිති සහ ඒවායේ භාවිතය පිළිබඳ විධිවිධානයන්ට අනුගතවීමට එය පූර්වාදර්ශයක් වන අතර ඵලදායී සන්නිවේදනය සහ ගැටලු විසඳීමේ හැකියාවන් වර්ධනයට ද ඉවහල් වේ.[10]

විචාරාත්මක චින්තනයක ආවශ්‍යක බව විමසීමේ දී එය භාෂාව සහ ඉදිරිපත් කිරීමේ හැකියාවන් වැඩි දියුණු කිරීමට, අදහස් හා එම අදහස් ප්‍රකාශ කරන ආකාරය පැහැදිලිව සහ ක්‍රමානුකූලව කිරීමට, යමක තර්කානුකූල ව්‍යුහය විශ්ලේෂණය



කරන්නේ කෙසේදැයි විග්‍රහ කිරීමට, යමක් තේරුම් ගැනීමේ කුසලතාවන් වැඩි දියුණු කිරීමට, නිර්මාණශීලීත්වය වර්ධනය කිරීමට, ගැටලුවක් සඳහා නිර්මාණශීලී විසඳුම් ඉදිරිපත් කිරීමට, ජනනය වන නව අදහස් ප්‍රයෝජනවත් වන ආකාරයට අදාළ කාර්ය සඳහා යොදා ගැනීමට, උත්පාදනය වන නව අදහස් ඇගයීමට ලක් කිරීමට, ඉන් හොඳම අදහස් තෝරාගැනීම හා අවශ්‍යය නම් ඒවා වෙනස් කිරීම සඳහා තීරණය කිරීම ආදියට විචාරාත්මක චින්තනය අත්‍යවශ්‍යය වේ.

විචාරාත්මක චින්තනය පාසල් ශිෂ්‍යයන්ට ද බෙහෙවින් වැදගත් ය. විචාරාත්මක චින්තන කුසලතා ඇති ශිෂ්‍යයන් වඩා ස්වාධීන ශිෂ්‍යයින් බවට පත්වේ. මේ සඳහා පංතිකාමර ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේදී ගුරුවරුන් විසින් මගපෙන්විය යුතු අතර එහිදී සිසුන්ගේ ඉගෙනුම් විලාසයන්, ශක්තීන් හා දුර්වලතා ඇගයීමට ලක්කරමින් ඉගෙනීම සංවර්ධනය කර ගැනීමට සහාය විය යුතු ය. පාසලක විෂයමාලාව ගත් කල්හි සියලු විෂයයන් ඉගැන්වීම සඳහා විචාරාත්මක චින්තනය අවශ්‍ය වන අතර විශේෂයෙන් විද්‍යාව විෂය උගන්වන අවස්ථාවලදී එම විෂය හැදෑරීමට භාවිත කරන මූලික ප්‍රවේශය විචාරාත්මක චින්තනයයි. එසේ ම සමාජ අධ්‍යයනය හෝ සාහිත්‍යය විෂයයන් ඉගැන්වීමේදී ද සමාජීය ප්‍රස්තුත ආදිය යොදා ගනිමින් ගුරුවරයාට විචාරාත්මක චින්තනය උපයෝගී කර ගනිමින් සිසුන් තුළ උසස් ප්‍රජානනයක් ඇති කළ හැකි ය. ඕනෑම විෂයක් ඉගැන්වීම සඳහා ගුරුවරයාට විචාරාත්මක චින්තනය වැදගත් වේ. බුද්ධිකලම්භන සාකච්ඡා මගින් ගුරුවරුන්ට සිසුන්ගේ විචාරාත්මක චින්තනය පුබුදු කළ හැකි ය. එතුළින් ශිෂ්‍යයාට යමක් ගැන සිතන ක්‍රියා කරන සෑම අවස්ථාවකම විචාරාත්මකව දැකීමේ නෛපුණ්‍යය ඇති වේ.

විද්‍යාඥයින් විද්‍යාත්මක ක්‍රම භාවිත කරන සෑම අවස්ථාවකම තමන්ගෙන් ප්‍රශ්න අසමින්, අදාළ තොරතුරු රැස් කිරීම හා තක්සේරු කිරීම තුළින්, හොඳින් තර්කානුකූලව නිගමන හා විසඳුම් වෙත පැමිණෙන අතර ඒවායේ ප්‍රතිඵල දැක්වීමේදී ඵලදායී ලෙස විචාරශීලීව සන්නිවේදනය ද කරයි. එසේ ම

ශිෂ්‍යයන්ට ද සිය දැනුම, ආකල්ප හා කුසලතා පිළිබඳව විචාරාත්මක සිතීමට ඇවැසි ඥානය මෙන් ම පෙළඹවීම ද සිදු කිරීම ගුරුවරුන්ගේ වගකීමකි. සිසුන් තුළ චින්තනය ගැන සිතීම වැනි අධිප්‍රජානන අවබෝධය ද ඇති කළ යුතු ය. විචාරාත්මක චින්තනය යනු ගුරුවරුන් විසින් භාවිත කරන අදහස්, තොරතුරු සහ කරුණු මතක තබා ගැනීමෙන් ඔබ්බට ගිය ඉගෙනීම්, චින්තනය සහ විශ්ලේෂණයන් විස්තර කිරීම සඳහා භාවිත කරන පදයක් වශයෙන් ද දැක්විය හැකි ය. සාමාන්‍ය ව්‍යවහාරයේදී විචාරාත්මක චින්තනය යනු සිතීමේ ක්‍රියාවලි සඳහා යොදාගත හැකි කුඩාම වචනයකි. සිසුන්ට විෂය කරුණු විශ්ලේෂණයට, සංස්ලේෂණය කිරීමට, නිර්මාණාත්මක චින්තනයෙන් තර්ක කිරීමට, විශ්ලේෂණාත්මකව ගැටලුවක් විසඳීමට හෝ නිගමනයකට එළඹීමට ද මෙම චින්තනය අවශ්‍ය වේ.

විචාරාත්මක චින්තනය මනෝ චිකිත්සක ව්‍යායාමයක් ලෙස ද සැලකේ. එය සොක්‍රටීස්, ඇරිස්ටෝටල් හා අයින්ස්ටයින් ආදීන් සුවිශේෂීව භාවිතකොට ඇත. විචාරාත්මක චින්තකයෙකුට සමාජ ගැටලුවක් පරීක්ෂා කර බලන්නේ කෙසේ ද, තර්කානුකූලව යමක් තේරුම් ගන්නේ කෙසේද යන්නත්, පුද්ගලික විනිශ්චය හෝ පක්ෂපාතීත්වය මත නොපිහිටා මධ්‍යස්ථව තීරණ ගන්නේ කෙසේද යන්නත් පිළිබඳව මනා අවබෝධයක් පවතී.[11] විචාරාත්මක චින්තන කුසලතා ඇති අයෙකුට තර්කානුකූල සම්බන්ධතා අවබෝධ කර ගැනීම තුළින් තර්ක ඉදිරිපත් කිරීම, තර්ක සැකසීම හා ඇගයීම, තර්කානුකූලව අස්ථාවරත්වයන් සහ පොදු වැරදීම් හඳුනා ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, අදහස්වල වැදගත්කම සහ එම වැදගත්කම හඳුනා ගනිමින් සිය විශ්වාසයන් සහ වටිනාකම් යුක්තිසහගත කිරීමට කටයුතු කිරීම ආදි ඉහළ බුද්ධිමය හැකියා පවතී. විචාරාත්මක චින්තනය තොරතුරු රැස්කර ගැනීමේ ක්‍රියාවලියක් ම නොවේ. හොඳ මතකයක් සහිත පුද්ගලයෙකුවීම හෝ කරුණු බොහෝ දන්නා කෙනෙකු වීම විචාරාත්මක චින්තනයේ දී අවශ්‍ය නොවේ. විචාරාත්මක චින්තකයෙකු ඔහු දන්නා දේවලින් යහපත් ඵල නෙළාගැනීමට සමත් වන අතර, ගැටලු විසඳා ගැනීමට අවශ්‍ය



තොරතුරු භාවිත කිරීම සහ තමාට දැනුම් දීම සඳහා තොරතුරු මූලාශ්‍රය සොයා ගැනීමට ඔහු දන්නේය. දැනුම වැඩිදියුණු කර ගැනීමට, තර්කන හැකියාව ශක්තිමත් කර ගැනීමට මෙකී චින්තනයෙන් හැකි වේ. විචාරාත්මක චින්තනය නිර්මාණශීලීත්වයේ අත්‍යවශ්‍ය අංගයක් වන හෙයින් පුද්ගල නිර්මාණාත්මක අදහස් ඇගයීම හා වැඩිදියුණු කිරීම සඳහා ද විචාරාත්මක චින්තනය සෑම පුද්ගලයෙකුම වර්ධනය කරගත යුතු කුසලතාවකි.

එසේ ම තවත් පසෙකින් විචාරශීලී චින්තනය යනු තොරතුරුවල හා හේතු දැක්වීමේ ක්‍රියාමාර්ගවල අගය හා නිරවද්‍යතාව ඇගයීමේ ක්‍රියාවලියකි. කුමක් විශ්වාස කළ යුතු ද? කුමක් කළ යුතු ද? යනුවෙන් තීරණය කිරීම සඳහා සංගතතාවයෙන් යුතුව විචාරශීලී චින්තනය භාවිත කිරීමට අභ්‍යන්තර පෙළඹීමක් සහිත වීම විචාරශීලී චින්තනයේ යෙදෙන අයගේ ලාක්ෂණික ගුණයක් වන බව ෆැශියන්ගේ අදහසයි. (Facione)[12] විචාරශීලීව සිතන්නෙකු ප්‍රත්‍යවේක්ෂණ හැකියාව, ගවේෂණ හැකියාව, විශ්ලේෂණ හැකියාව මෙන් ම උසස් හා සංකීර්ණ ලෙස සිතීමේ හැකියාවෙන් සමන්විත වේ. එදිනෙදා ජීවිතයේ තීරණ ගැනීම සඳහා ද මෙකී හැකියාව වැදගත් වන අතර යමකින් යමක් සංසන්දනාත්මකව තෝරා ගැනීම ආදී අවස්ථාවන්හිදී ද මෙම හැකියාව භාවිතයට ගනියි. එසේ ම ගැටලු විසඳීමට ද මෙම චින්තනය අවශ්‍ය වේ. ඉගෙනුම් කාර්යයන්හි දී ශිෂ්‍යයකුට ගණිත ගැටලුවක් හෝ විචාරාත්මක ප්‍රශ්නයකට පිළිතුරු සැපයීමේදී විචාරාත්මක චින්තනය අවශ්‍යය වේ. ඒ අනුව විශේෂයෙන් නිදසුන් සහිත පුළුල් ප්‍රවේශයකින් ගැටලු විසඳීමට විචාරාත්මක චින්තනය අත්‍යවශ්‍ය බව හඳුනාගත හැකි ය. එහෙත් විභාග කේන්ද්‍රීය අධ්‍යාපන ක්‍රමයක් තුළ විචාරාත්මක චින්තනයට අවකාශය ලැබෙන්නේ මද වශයෙනි. එම අධ්‍යාපනයෙන් ස්මෘතිය මැනීම ප්‍රමුඛත්වයෙහිලා සලකන බැවිනි. නිර්මාණශීලීත්වයෙන් යුතු විචාරශීලී චින්තනයකින් හෙබි පුද්ගලයකු බිහි කිරීම රටක අධ්‍යාපන ක්‍රියාවලියක වගකීම වේ. එහෙත් විසි එක් වන ශතවර්ෂයෙහි ශ්‍රී ලාංකේය අධ්‍යාපනය ද